# ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1:1. තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1. ගිණුම්කරණ ප්‍රතිපත්ත

මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 1.7 අනුව රජයේ ප්‍රදාන මගින් ලබාගත් වත්කම්, එම වත්කම්වල ජීව කාලය තුළ ක්‍රමානුකූල පදනමක් මත ආදායම් ලෙස හඳුනාගන්නා බව සඳහන් කළද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 21 වන සියවසට උසස් අධ්‍යාපන ව්‍යාපෘතියෙන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනවලට සමාලෝචිත වර්ෂයේදී ලබා දෙන ලද රු.6,095,192 ක් වටිනා පරිගණක, ප්‍රක්ෂේපන යන්ත්‍ර හා ලීබඩුවල වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කිරීමේදී රු.977,112 ක් අඩුවෙන් ක්ෂය කර තිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට ආයෝජන වෙනුවෙන් පොළිය නිවැරදිව ගණනය නොකිරීම හේතුවෙන් ආයෝජන පොළිය රු.158,614 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) උසස් තාක්ෂණ ආයතනයක රු.23,378,804 ක් වූ කෙරීගෙන යමින් පවතින ගොඩනැගිලි ප්‍රාග්ධනිත කර තිබුණු අතර ක්ෂය කර අවසන් වී තිබුණු එකතුව රු.163,727,770 ක දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

## 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2005, 2006 වර්ෂවලදී උසස් තාක්ෂණ ආයතන තුනක දැනට සේවයේ නියුතු නිලධාරීන් හතරදෙනෙකුට ලබාදී තිබූ රු.134,395 ක ආපදා ණය වාරික හා පොලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රකාශනයේ පැවති රු.12,627,188 ක් වූ ණය හිමි ශේෂය තුළ රාජ්‍ය අංශයට හා පෞද්ගලික අංශයට ගෙවිය යුතු වර්ෂ 04 ක් ඉක්මවූ ණය ශේෂයන් පිළිවෙලින් රු.6,795,503 ක් හා රු.1,273,473 ක් විය.

## 1.2.4. විගණනය සඳහා සාක්ෂි නොවීම.

එකතුව රු.13,958,556 ක් වූ ණයහිමි හා ණයගැති ශේෂයන් සනාථ කර ගැනීම සඳහා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කර නොතිබුණි.

## 1.2.5 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1997 ජනවාරි 24 දිනැති අංක116 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් අනියම් කම්කරුවන් තුන්දෙනෙකු උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවයට මුදාහැර ආයතනය විසින් සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.618,979 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණද, ඒ සඳහා විධිමත් අනුමැතියක් නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2.1 වගන්තියේ 2.11 උප වගන්තිය | එකතුව රු.2,203,124,581 ක් වටිනා දේපල, පිරියත උපකරණ වෙනුවෙන් වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 135 | 2012 වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය බලතල පවරා නොතිබුණි. |
| (ඈ) | ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදය | උසස් තාක්ෂණ ආයතනයන්හි නිවාඩු ලේඛන යාවත්කාලීන පවත්වා නොතිබුණු අතර, එක් උසස් තාක්ෂණ ආයතනයක අධ්‍යක්ෂවරයෙක් සමාලෝචිත වර්ෂයේ දී නිවාඩු ඉල්ලුම්පත්‍රවලින් තහවුරු නොකර නිවාඩු 44 $\frac{1}{2}$ ක් ලබාගෙන තිබූ අවස්ථාවක්ද නිරීක්ෂණය විය. |
| (ඉ) | 2008 ජනවාරි 02 දිනැති අංක AI/02/15 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය | උසස් තාක්ෂණ ආයතන දෙකක කථිකාචාර්යවරුන්ගේ දේශන පැවැත්වීම පරීක්ෂා කළ හැකි පරිදි චක්‍රලේඛය ප්‍රකාරව කළවැඩ ලේඛනය නිසි පරිදි සම්පූර්ණ කර නොතිබුණි. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.108,514,206 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා ඌනතාවය රු.101,085,841 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.7,428,365 කින් එනම් සියයට 7 කින් පිරිහීම සඳහා පුද්ගල පඩිනඩි, ගිවිසුම්ගත සේවා සහ පුහුණු හා ඇගයීම් වියදම් පිළිවෙලින් රු.12,616,412 කින්ද, රු.12,512,605 කින්ද හා රු.11,601,443 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

## 2.2 ආයතනයට එරෙහිව ඇති නෛතික සිද්ධි.

ආයතනයට එරෙහිව අධිකරණයේ ගොනුකර තිබුණු නඩුවක් සඳහා රු.342,960 ක සේවක වන්දි මුදලක් ගෙවීමට ඇති හැකියාව ඉහල බැවින් ඒ සඳහා ප්‍රතිපාදනයක් කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උසස් තාක්ෂණ ආයතන විසින් පවත්වාගෙන යනු ලබන සමස්ථ පාඨමාලාවන්හි අනුව 2011 වර්ෂයේ දී බඳවා ගැනීමේ ප්‍රතිශතය පෙර වර්ෂය හා සැසඳීමේදී සියයට 17 කින් වැඩිවී තිබුණද, 2012 වර්ෂයේදී එම ප්‍රමාණය වැඩිවී තිබුණේ සියයට 9 කින් පමණි.

(ආ) 2012 වර්ෂයේ දෙවන අර්ධ වර්ෂය තුළ විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 38 ක් පමණක් විභාගය සමත් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| උසස් ජාතික පාඨමාලාවන් | විභාගය සඳහා පෙනී සිටි සංඛ්‍යාව | සමත් වූ සංඛ්‍යාව | විභාගය සඳහා පෙනී සිටි සංඛ්‍යාවෙන් සමත් වූ සංඛ්‍යාවෙහි ප්‍රතිශතය සියයට |
|---|---|---|---|
| ගණකාධිකරණ | 3234 | 1443 | 45 |
| කළමනාකරණ | 774 | 342 | 44 |
| ව්‍යාපර පරිපාලන | 187 | 66 | 35 |
| ව්‍යාපාර මූල්‍යකරණ | 63 | 37 | 59 |
| ඉංග්‍රීසි | 1670 | 627 | 38 |
| තොරතුරු තාක්ෂණ | 712 | 215 | 30 |
| සංචාරක හා ආගන්තුක සත්කාරක කළමනාකරණය | 107 | 43 | 40 |
| ආහාර තාක්ෂණ | 33 | 14 | 42 |
| ඉංජිනේරු | 897 | 114 | 13 |
| ප්‍රමාණ හා මිනුම් සමීක්ෂණ | 79 | 19 | 24 |

| | | | |
|---|---|---|---|
| ගොඩනැගිලි සේවා ඉංජිනේරු | 26 | 09 | 35 |
| තාක්ෂණික (කෘෂි) | 260 | 158 | 61 |
| **සමස්ථ ප්‍රතිඵලය** | **8042** | **3087** | **38** |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උසස් තාක්ෂණ ආයතන හයක් විසින් පරිහරණය කරනු ලබන ඉඩම් 2012 දෙසැම්බර් 31 දින දක්වා ආයතනයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) උසස් තාක්ෂණ ආයතනය පිහටුවීමේ ඉලක්ක හා අරමුණු අතර පාඨමාලාවල විවිධත්වයක් ඇතිකිරීම, නව පාඨමාලා හඳුන්වාදීම හා ගාස්තු අයකරන පාඨමාලා හඳුන්වාදීම ආදිය ඇතුළත් වූ අතර 2012 වර්ෂයේ ක්‍රියාකාර් සැලැස්මේ ඇතුළත් වූ පහත සඳහන් අධ්‍යයන පාඨමාලාවන් 2012 දෙසැම්බර් 31 දින දක්වා උසස් තාක්ෂණ ආයතනය විසින් හඳුන්වාදීමට කටයුතු කර නොතිබුණි.

- උසස් ජාතික කොන්ත්‍රාත් ඩිප්ලෝමා
- උසස් ජාතික මෘදුකාංග ඉංජිනේරු ඩිප්ලෝමා
- උසස් ජාතික සන්නිවේදන ඩිප්ලෝමා
- උද්‍යාන විද්‍යාව පිළිබඳ තාක්ෂණ සහතික පාඨමාලාව
- මැණික් පිළිබඳ තාක්ෂණ සහතික පාඨමාලාව

ඉහත කරුණු සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන්ද කරනු ලැබේ.

i. එක් උසස් තාක්ෂණ ආයතනයක් විසින් උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව හඳුන්වා දී තිබුණු නමුත් ස්ථිර දේශකවරුන් බඳවාගෙන නොතිබුණි. සංචාරක හා ආගන්තුක සත්කාරක කළමනාකරණ පාඨමාලාව හඳුන්වාදීමේදී පාඨමාලා සැකිල්ල (course outline) මත ඉගැනවීම් කටයුතු කර තිබුණු අතර 2012 වර්ෂය අවසාන වන තෙක්

පාඨමාලාවන්ට අවශ්‍ය ප්‍රමාණවත් සම්පත් සැපයීමට ප්‍රධාන කාර්යාලය විසින් පියවර ගෙන නොතිබුණි.

ii. එක් උසස් තාක්ෂණ අංශයක් විසින් 2012 සහ 2013 අධ්‍යයන වර්ෂ සඳහා කිසිදු ශිෂ්‍යයෙකු බඳවා ගෙන නොතිබුණු අතර දැනට පවත්වාගෙන යනු ලබන උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව සඳහා බාහිර කථිකාචාර්යවරුන් පමණක් දේශන පවත්වා තිබුණත් , එම දේශන පැවැත්වීම සඳහා ස්ථිර ස්ථානයක් නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් සහ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2012 කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ ද 2013 මැයි 28 දිනදීය.

### 4.2 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දින හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය ප්‍රකාර මුදල් වර්ෂය ආරම්භයට දින 15 කට ප්‍රථම සංයුක්ත සැලැස්ම විගණකාධිපති වෙත ලබා දිය යුතු වුවද, 2012 වර්ෂයේ සංයුක්ත සැලැස්ම විගණකාධිපති වෙත ලබා දී තිබුණේ 2013 මැයි මාසයේදීය.

### 4.3 ක්‍රියාකාරී සැලැස්ම

ක්‍රියාකාරී සැලැස්ම සකස්කර තිබුණද වාර්ෂික අයවැය ලේඛනය හා මූල්‍ය ප්‍රකාශන සමඟ සමගාමී නොවූ හෙයින් ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක ඉටු කර ගැනීමේ ප්‍රගතිය පිළිබඳව විගණනයේදී පරීක්ෂා කළ නොහැකි විය.

### 4.4 ප්‍රසම්පාදන සැලැස්ම

2012 වර්ෂයේ රු.138,963,492 ක මිලදී ගැනීම් සිදුකර තිබුණද, 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4.5 අයවැය පාලනය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 ප්‍රකාරව සහ මූල්‍ය ප්‍රකාශනවලට සමගාමීව අයවැය ලේඛන පිළියෙල කර නොතිබුණු අතර අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 29 සිට සියයට 56 දක්වා විචලනයන් වූයෙන් අයවැය ලේඛනය මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 4.6 වාර්ෂික වාර්තා සභාගත කිරීම.

2010 හා 2011 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

# 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ඉන්වෙන්ට්‍රි පාලනය

(ආ) ඉඩම් හා ගොඩනැගිලි පවරා ගැනීම හා ගිණුම් ගත කිරීම

(ඇ) වාහන පාලනය

(ඈ) පුස්තකාල පරිපාලනය

(ඉ) නේවාසිකාගාර පාලනය

(ඊ) ගොවිපොළ පාලනය

(උ) විභාග පැවැත්වීම

(ඌ) උප පත්‍රිකා පොත්